**අඹන්ගහකෝරලේ ප්‍රාදේශීය සභාව - 2023**

------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අඹන්ගහකෝරලේ ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2023 දෙසැම්බර් 31 දිනට අඹන්ගහකෝරලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය .

1.4 විගණන විෂය පථය ( මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | රයිතලාව සිට ඉඹුල්ගොල්ල දක්වා පිලපිටිය කෘෂි මාර්ග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ගෙවියයුතු රු.4,990,000 ක් ණය හිමියන් යටතේ රු.499,000 ක් ලෙස සටහන් කිරීම හේතුවෙන් ණයහිමියන් රු.4,491,000 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි. | -එම- | -එම- |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පිළියෙල කළ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ආදායම් ශේෂ 2 ක හා ඒකක 10 ක ගබඩා ලෙජරය අනුව ශේෂය උප ලේඛන සමඟ සැසඳීමේදී රු.122,072 ක වෙනසක් නිරීක්ෂණය විය. | -එම- | -එම- |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.3,854,123 ක වත්කම් විෂයයන් 3 ක් සහ රු.516,002 ක බැරකම් විෂයයන් 13 කට අදාල ස්ථාවර වත්කම් ලේඛනය, ලිපිගොනු හා බැරකම් ලේඛන ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | ගිණුම් ශේෂයන්ට අදාල නිවැරදි ලේඛන හඳුනා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරන බව. | එක් එක් ශේෂයන් තහවුරු කිරීම සඳහා ලේඛන හා ලිපිගොනු පවත්වා ගතයුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.**

| | නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිදේර්ශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| (i) | 24 වගන්තිය | සභාව විසින් නඩත්තු කරනු ලබන පාරවල් හා පටු මංමාවත්වල නාම ලේඛනයක් ගැසට් පත්‍රයේ පලකර ඇතත්, පිඹුරුපත් සකස් කර මායිම් සළකුණු කර විධිමත් පරිදි එකී කාර්යය සිදුකර නොතිබූ අතර අනුමැතිය ලැබී තිබූ මාර්ග 9 ක් ගැසට් කිරීමට කටයුතු කර නොතිබුණි . එසේම මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීන කර නොතිබුණි. | හදුනාගන්නා ලද මාර්ග ප්‍රාදේශීය ලේකම් මඟින් මාතලේ මිනුම්දෝරු කාර්යාලය වෙත මැනුම් කටයුතු සිදුකිරීම සඳහා යොමුකර ඇති බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළයුතුය. |
| (ii) | 127 වගන්තිය | සභාව පරිහරණය කරන සුසාන භූමි 14 ක මායිම් ලකුණු කර අයිතිය පවරාගෙන ලේඛන ගතකර නොතිබුණි. | මැනුම් නියෝග ඉල්ලීම් කිරීම සඳහා මූලික කටයුතු ආරම්භ කර ඇති බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළයුතුය. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) | රීති 59 | බලප්‍රදේශය තුළ බලපත්‍ර ලබාගතයුතු ආයතන සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර ලැයිස්තුවක් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර නොතිබුණි . | රීති 60 හි සඳහන් තොරතුරු ඇතුළත්කොට ලැයිස්තුවක් සකස් කිරීමට කටයුතු සිදුකරමින් පවතින බව. | රීති ප්‍රකාරව කටයුතු කළයුතුය. |
| (ii) | රීති 61 | පී.එස්. 26 ප්‍රකාරව පිළියෙල කළයුතු කර්මාන්ත / වෙළඳ ව්‍යාපාර බදු පිළිබඳ ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | පී.එස්. 26 ප්‍රකාරව ලේඛනයක් ඉදිරියේදී පිළියෙල කරන බව. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.244,365 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු. 150,398 ක් විය .

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කල තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් බදු | 182,500 | 7,977 | 5,092 | 11,591 | 147,500 | 7,914 | 7,139 | 8,706 |
| (ii) | කුලී | 464,400 | 271,260 | 241,970 | 59,225 | 357,400 | 245,320 | 255,529 | 29,935 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 250,000 | 297,000 | 297,000 | - | 245,100 | 293,900 | 293,900 | - |
| (iv) | වෙනත් ආදායම් | 1,400,000 | 2,427,155 | 2,270,244 | 965,594 | 1,400,000 | 1,626,705 | 1,502,976 | 808,683 |
| | එකතුව | 2,296,900 | 3,003,392 | 2,814,306 | 1,036,410 | 2,150,000 | 2,173,839 | 2,059,944 | 847,324 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබූණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ජනවාරි 11 දිනැති අංක CPC/RDHS/MT/MOH/AMB/FS/01/2023 දරන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීගේ | මේ වන විට ක්ලෝරීන්කරණය සිදු නොකරන අතර සපයන ජලය ක්ලෝරීන්කරණය | සභාව මහජන සෞඛ්‍ය පිළිබඳ අවධානය යොමුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලිපියට අනුව සහා බල ප්‍රදේශය තුල පවතින ජල යෝජනා ක්‍රම 8 ක් පිරිපහදු කිරීමකින් තොරව පානීය ජලය ලබාදෙන බවත්, ප්‍රදේශයේ ජනතාව අනාරක්ෂිත ජලය පරිහරණය කිරීමෙන් බොහෝ රෝගාබාධවලට ගොදුරුවන බවත්, නිරීක්ෂණය කරන ලද බව, දන්වා ඇති නමුත් මේ පිළිබඳ සභාවේ අවධානය යොමුකර නොතිබුණි . | ක්‍රියාවලියට භාජනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග දැනටමත් ආරම්භ කර ඇති බව. | |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබියයුතු ගිණුම් ශේෂ 4 ක එකතුව රු.4,702,059 ක් වී තිබුණු අතර, වසර 1 ට වැඩි හා 5 ට අඩු ශේෂය රු.485,749 ක් හා වසර 5 ට වැඩි ශේෂය රු.2,914,879 ක් අයකර නොතිබුණි. | ව්‍යාපෘති හා විවිධ ණයගැති ශේෂයන් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කරන බව. | ලැබියයුතු ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළයුතුය . |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවියයුතු ගිණුම් ශේෂ 2 ක එකතුව රු.2,976,872 ක් වූ අතර, ඉන් නිරවුල් නොකර පවතින කාලය වසර 1 ත් 5 ත් අතර ශේෂය රු.522,004 ක් හා වසර 5 ට වැඩි ශේෂය රු.1,420,168 ක් නිරවුල් කර නොතිබුණි. | මුදල ඉදිරියේදී ගෙවීමට කටයුතු කරන බව. | ගෙවියයුතු ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කළයුතුය. |
| (ඇ) | පසුගිය වර්ෂ 4 ක කාලය තුළ ලැබී තිබූ ගොඩනැඟිලි අයදුම්පත් 104 න් ගොඩනැඟිලි 30 ක් සඳහා සංවර්ධන බලපත්‍ර නිකුත් කර ඇති අතර, එයින් ගොඩනැඟිලි 2 කට පමණක් අනුකූලතා සහතික නිකුත් කර තිබුණි. 2020 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලය තුල අනුමත නොකළ අයදුම්පත් 68 ක් සම්බන්ධව පසුවිපරම් කටයුතු සිදුකර අවශ්‍ය ක්‍රියාමාර්ග අනුගමනය කර නොතිබුණි. | අනුකූලතා සහතික නිකුත් කිරීමට තාක්ෂණ නිලධාරි විසින් විමර්ශන සිදුකරන ලෙස දැනුවත් කර ඇති බව. | ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදුකර අනුකූලතා සහතික නිකුත් කිරීමට කටයුතු කළයුතුය. |

## 3.3 නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
| --- | --- | --- |
| සභාවට අයත් එකතුව රු.7,001,102 ක වාහන, යන්ත්‍රෝපකරණ හා උපකරණ 4 ක් වසර 3½ ත් වසර 16 අතර කාල පරාසයක සිට නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පවතින බවත් අත් ට්‍රැක්ටර් හා ජල බවුසර් ටේලරයක් ධාවනයෙන් ඉවත් කර වසර 18 ත් 8 ත් අතර දීර්ඝ කාලයක් ගතවී ඇතත්, සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොමැති බව නිරීක්ෂණය විය. | ඩ්‍රම්ප් ට්‍රක් රථය හා විදුලි ජනක යන්ත්‍රය වෙනත් ආයතනයක් සමඟ හුවමාරු කිරීමට හෝ කුලී පදනම මත ලබාදීමට බලාපොරොත්තු වන බව හා අළුත්වැඩියා කිරීමට නොහැකි වාහන අපහරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව. | අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළයුතුය . |

## 3.4 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
| --- | --- | --- |
| සභාව පරිහරණය කරන රු.533,750 ක් වටිනා ඉඩම් 70 ක හා රු.1,784,050 ක් වටිනා වාහන 03 ක අයිතිය පවරාගෙන නොතිබුණි. | පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව. | අයිතිය පවරා ගැනීමට කටයුතු කළයුතුය. |

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
| --- | --- | --- |
| රු.3,128,891 ක් වැයකර පරගහමඩ කඩ කාමර ඉදිකිරීමේ ව්‍යාපෘතියේ තෝරාගත් ටෙන්ඩර්කරුවන් මූලික වියදම් (Preliminaries) සඳහා මිල ගණන් ඉදිරිපත් කර නොතිබියදී අවසන් බිල්පතේ මූලික වියදම් සඳහා රු.20,438 ක් ඇතුළත් කර නිර්දේශ කර ගෙවා තිබූ අතර, අනුමත සැලසුමේ වැර ගැන්නුම් සඳහා ඇතුළත් කළ කම්බිවලට වඩා කිලෝ ග්‍රෑම් 128 ක් වෙනුවෙන් රු.51,360 ක් වැඩිපුර ගෙවා තිබූ අතර, අනුමත ඉංජිනේරු සැළසුමට පිටින් Tie Beam හා Main Beam වෙනුවෙන් කොන්ක්‍රීට් 0.728 $m^3$ සඳහා රු.18,107 ක් වැඩිපුර ගෙවා තිබුණි. | පළාත් පාලන ඉංජිනේරු තුමාගේ නිර්දේශ මත කම්බි එලීම සිදුකර ඇති අතර මේ සම්බන්ධයෙන් ගොඩනැගිල්ල නැවත පරීක්ෂා කර, මැනුම් කටයුතු කිරීමෙන් පසුව කඩිනමින් පිළිතුරක් ලබාදෙන බව. | ඇස්තමේන්තු ප්‍රකාරව ඉදිකිරීම් සිදුකර තිබේද යන්න තහවුරු කර ගෙවීම් කළයුතුය. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සේවක සංඛ්‍යාව, තථ්‍ය සේවක සංඛ්‍යාව හා සැසඳීමේදී තනතුරු 07 ක පුරප්පාඩු 10 ක් හා එක් තනතුරක අතිරික්තයක් පැවතුණි. | ඉතාමත් අසීරුවෙන් ආයතනික කටයුතු පවත්වාගෙන යන බව. | අනුමත කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාමට කටයුතු කළයුතුයි. |